# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,715 — 1966 සැප්තැම්බර් 30 වැනි සිකුරාද — 1966.9.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන | 685 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන | — |
| නගරාධිපතිරු-ඇමතිරු | 686 | අය-වැය ලේඛන | 690 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | — | දේපළ විකිණීම | 693 |
| අතුරු ව්‍යවස්ථා | 688 | මාර්ග කොමිටි දැන්වීම් | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් | 694 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී—බී 69/41
ප.පා.දෙ—ජී. ඒ. 1/11

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වන වගන්තියේ (1) උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ රිල්පොළ ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

9-1312—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

ඇල්.ඩී.—බී 60/43
ඇල්.ජී.ඩී.—ඒ ඩී 2/274

### ගෙවල් කුලී සීමා කිරීමේ පනත

(274 වැනි අධිකාරය වන) ගෙවල් කුලී සීමා කිරීමේ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, මුරුගේසන් තිරුචෙල්වම් වන මම, මේ නිවේදනයෙන්—

(අ) කලින් පාදුක්කේ සනීපාරක්ෂක මණ්ඩල නගර සීමාව ඇතුලත වූ ප්‍රදේශය ඉහතකී පනත ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරමි. තවද,

(ආ) මේ නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දිනය මේ නිවේදනය වලංගු විය යුතු දිනය ලෙස නියම කරමි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

9–1333—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පෙර වසරේ සඳහා ගනු ලැබූවක් කෙරෙහි යෙදේ.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචන යෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත හටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය හට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරු වනට අවසර දෙනු ලැබේ.

7 වයස පිළිබඳ කොන්දේසි.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ලංකාණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ලංකාණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම්ව සිටින්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරන ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වචමතා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නාමයට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැල්ලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නාමයට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා සෑම සැකලියකම සුදුසු සැබෑ නිශ්චය කරගනු ලැබිය, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට අමුණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ————තනතුර සඳහාවූ අයදුම්පතයි.

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි ඔහු ලංකාවේ නුපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අත්හිබට සම්පූ වූ භාෂාවේ දිනයක් සමඟ :—

(අ) සිංහල :———.

(ආ) ඉංග්‍රීසි :———.

(ඇ) දෙමළ :———.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :———.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :———.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න) :———.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :———.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිතර් (තනතුරු). පළාත් පාලනායතන හා කාලසීමාවක් : ———.

(ඇ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :———.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය: ———.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :———.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—

සේනාංකය තරාතිරම. සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ ඒස්තං :———.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳ ප්‍රවීණතාවක් ඇද්ද :——— ———.

(අ) සිංහල :———.

(ආ) දෙමළ :———.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :———.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :———.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :———.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :———.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :———.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### II ශ්‍රේණියේ බෙහෙත් ශාලා භාර සිඩ ආයුර්වේද්‍ය තනතුර

1966.4.1 දින දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරන ලද නිවේදනයට වැඩිදුරටත්ය.

2. පහත සඳහන් නිලධාරීන් ඉහත තනතුරුවලට පත්කිරීම සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරාගෙන ඇත :—

1. කේ. මුරුගේසපිල්ලෙයි මහතා,
වඩ්ඩු නැගෙනහිර,
සිතන්කර්නි.

2. ඇස්. රාජවේලු මහතා,
" ක්ෂත්‍රිය වාස ",
නැගෙනගිර කරවෙඩ්ඩි,
කරවෙඩ්ඩි.

මොවුනට වහාම පත්වීම් දීම සඳහා කොමිෂන් සභාව භාර නොගනියි. එසේ වුවද, පළාත් පාලන සේවයේ පුරප්පාඩු ඇතිවන පරිදි ඒ අවස්ථාවල පත්වීම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 සැප්තැම්බර් මස 17 දින,
තැ. පෙ. 530, කොළඹ.

9-1311—66.9.30 දින අංක 14,71F දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.—බී. 18/65.

## මාවනැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වන සහ 156 වන වගන්ති යටතේ මාවනැල්ල සුළු නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු ය :—

(අ) කබුක් ගල්, බොරලු හෝ කළුගල් සඳහා වළවල් හෑරීම.
(ආ) ෂීට් රබර් ගබඩා කිරීම.
(ඇ) මෝටර් රථ සර්විස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඈ) මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඉ) ටයර් හා ටියුබ් වොල්කනයිස් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඊ) බෙලෙක් වැඩ පොළක් පවත්වාගෙන යාම.
(උ) ස්වර්ණාභරණ සාදන ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඌ) ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

(ඩ) පරණ යකඩ කෑබලි විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඪ) යකඩ බඩු විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ණ) වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
(ත) ලී මඩුවක් පවත්වාගෙන යාම.
(ථ) දර මඩුවක් පවත්වාගෙන යාම.
(ද) ලී බඩු සාප්පුවක් පවත්වාගෙන යාම.
(ධ) මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
(න) තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
(ප) හිස් බෝතල ගබඩා කිරීම.
(ඵ) හිස් ගෝනි ගබඩා කිරීම.
(ෂ) කොප්පරා ගබඩා කිරීම.
(ත) විදුලි බලයෙන් හෝ තෙල් වලින්, වාෂ්ප බලයෙන් හෝ යම් බලයකින් ක්‍රියා කරවනු ලබන යන්ත්‍ර පාවිච්චි කරනු වෙන යම් කර්මාන්තයක්.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු ය:—

(අ) ක්‍රේප් රබර් සෑදීම හා දුම් ගැස්සීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
(අ) ක්‍රේප් රබර් සෑදීම හා දුම් ගැස්සීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
(ආ) රබර් ෂීට් සෑදීම සඳහා අත් රෝලක් පවත්වාගෙන යාම.
(ඇ) රබර් ෂීට් දුම්ගැස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඈ) සුරුට්ටු සෑදීම.
(ඉ) යන්ත්‍රානුසාරයෙන් වී කෙටීම.
(ඊ) යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ වෙනත් කුළු බඩු ඇඹරීම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතු ය:—

(අ) ෂීට් රබර් දුම් ගැස්සීම හා සෑදීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ආ) හාල් මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් පවත්වාගෙන යාම.
(ඇ) අම්ලකර පෑස්සීම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඈ) බැටරි පිරවීමේ ස්ථානයක්.
(ඉ) කම්මලක් පවත්වාගෙන යාම.
(ඊ) කොහුවලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.
(උ) සිසිල් බීම සාදන ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඌ) ගඩොල් හෝ උළු සෑදීම.
(එ) ගඩොල් හා උළු ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඒ) හුණු පෝරණයක් පවත්වාගෙන යාම හෝ හුණු ගබඩා කිරීම.
(ඔ) රෙදි ඩ්‍රයි ක්ලීන් කරන හා සායම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඕ) කොප්පරා සෑදීම.
(ක) විදුලි බලයෙන් හෝ තෙල් වලින්, වාෂ්ප බලයෙන් හෝ වෙන යම් බලයකින් ක්‍රියා කරවනු ලබන යන්ත්‍ර පාවිච්චි කරනු ලබන වෙන යම් කර්මාන්තයක්.

2. පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

(අ) ක්‍රේප් රබර් සෑදීම හා දුම් ගැස්සීම සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
(ආ) රබර් ෂීට් සෑදීම සඳහා අත් රෝලක් පවත්වාගෙන යාම.
(ඇ) රබර් ෂීට් දුම් ගැස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඈ) සුරුට්ටු සෑදීම.
(ඉ) යන්ත්‍රානුසාරයෙන් වී කෙටීම.
(ඊ) යන්ත්‍රානුසාරයෙන් මිරිස් හෝ වෙනත් කුලු බඩු ඇඹරීම.

3. පහත සඳහන් ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය:—

(අ) ෂීට් රබර් දුම් ගැස්සීම හා සෑදීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ආ) හාල් මෝලක් හෝ වී කොටන යන්ත්‍රයක් පවත්වාගෙන යාම.
(ඇ) අම්ලකර පෑස්සීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඈ) බැටරි පිරවීමේ ස්ථානයක්.
(ඉ) කම්මලක් පවත්වාගෙන යාම.
(ඊ) කොහුවලින් සෑදූ භාණ්ඩ ගබඩා කිරීම.
(උ) සිසිල් බීම සාදන ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඌ) ගඩොල් හෝ උළු සෑදීම.
(එ) ගඩොල් හෝ උළු ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
(ඒ) හුණු පෝරනයක් පවත්වාගෙන යාම හෝ හුණු ගබඩා කිරීම.
(ඔ) රෙදි ඩ්‍රයි ක්ලීන් කරන හා සායම් කරන සථානයක් පවත්වාගෙන යාම.
(ඕ) කොප්පරා සෑදීම.

9–1331—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී 54/47.

## එරාවූර් සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 වැනි වගන්ති යටතේ එරාවූර් සුළු නගර සභාව විසින් පනවනු ලැබ එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
සථිර ලේකම්,

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

## අතුරු ව්‍යවස්ථාව

1965 පෙබරවාරි මස 5 වන දින අංක 14,312 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙන් අවසන් වරට සංශෝධිත, 1949 ජනවාරි මස 21 වැනි දින අංක 9.939 දරන ගැසට් පත්‍රයේ පළවූ එරාවූර් සුළු නගර සභාව විසින් පනවනු ලැබූ අතුරු ව්‍යවස්ථා, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ "අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙහි අර්ථ නිරූපණයෙහි "රෙදි අපුල්ලන සථානයක් පවත්වාගෙන යාම" යන වචන වෙනුවට "රෙදි අපුල්ලන සථානයක් පවත්වාගෙන යාම, අම්ල වැල්ඩින් හෝ විදුලිය වැල්ඩින් පෑස්සුම් වැඩ කරන ඕනෑම ව්‍යාපාරයක්, විකිණීම පිණිස යකඩ ගබඩා කරන සථානයක් පවත්වාගෙන යාම, විකිණීම පිණිස ලුණු මාළු හෝ කරවල ඕනෑම ප්‍රමාණයක් ගබඩා කරන සථානයක් පවත්වාගෙන යාම, ඡායා රූප චිත්‍රාගාරයක් පවත්වාගෙන යාම, පිංතූර රාමු කරන සථානයක් පවත්වාගෙන යාම" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

9–1323—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඞී—බී 48/47.

## හික්කඩුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරයවන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ හික්කඩුව සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා කෙරෙහි පැවරී තිබෙන බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දීය.

## අතුරු ව්‍යවස්ථාව

සභාව විසින් පනවනු ලැබ 1948 අප්‍රේල් 16 වන දින අංක 9,853 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ අතුරු ව්‍යවස්ථාවල 1 වන අතුරු ව්‍යවස්ථාවෙහි "යෙදුම් පිළිබඳ අර්ථ නිරූපණය" යන සිරස්තලය යටතේ වූ අප්‍රසන්න වූ හෝ අන්තරාය දයක ව්‍යාපාරය යන්නෙහි විස්තරයෙහි "අප්‍රසන්න ව්‍යාපාරය යන්න යටතේ "අයිස් ක්‍රීම් සෑදීම" යන වචන වෙනුවට පහත සඳහන් වචන, එනම්:—

"අයිස් ක්‍රීම් සෑදීම, ලී බඩු වෙළඳ සැලක් පවත්වාගෙන යාම හෝ ලී බඩු සෑදීම, මිනී පෙට්ටි සෑදීම හෝ මිනී පෙට්ටි ගබඩා කිරීම"

යන වචන ආදේශ කිරීමෙන් හා "අන්තරායදායක ව්‍යාපාර" යන්න යටතේ "බෝතල දුසිම් 12 වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කිරීම" යන වචන වෙනුවට පහත සඳහන් එනම්:—

"බෝතල දුසිම් 12 වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කිරීම, පින්තූර හෝ ඡායාරූප රාමු කිරීම, ලුබ්රිකේටිං තෙල් ගබඩා කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා මෙයින් තව තවත් සංශෝධනය කරනු ලැබේ.

9–1310—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

ඇල් ඩී.—බී 13/64.

## චුන්නාකම් සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වැනි වගන්ති යටතේ චුන්නාකම් සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් චුන්නාකම් සුළු නගර සභාව අදහස් වේ.

"නගර ප්‍රදේශය" යනුවෙන් සභාවේ පරිපාලන සීමා ඇතුළතවූ ප්‍රදේශය අදහස් වේ.

2. නගර ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම හෝ යම්කිසි විශේෂ කොටසක කසළ ශෝධන සේවයක් ඇති කරනු ලැබීමෙන් පසු, ඒ සේවය එසේ ඇති කරනු ලැබූ ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ස්ථානයක පදිංචිකරු විසින්, ස්වකීය ස්ථානයෙන් බැහැරලන සියලුම අලු, කුණු රොඩු හා අනිකුත් සියලුම කැලි කසළ, සුදුසු ආවරණයක් සහිතවූ ද, සභාපති විසින් අනුමත කරනු ලැබිය හැකි යම් හැඩහුරුකමක හා ප්‍රමාණයක බාල්දියකට හෝ කුඩයකට දැමීමට සැලැස්විය යුතුය.

3. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් ස්ථානයක පදිංචිකරු විසින්—

(අ) අණබෙර හැසිවීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් සභාපති විසින් වරින්වර දැනුම් දිය හැකි යම් යම් කාල වේලාවල් අතර තුරදී දිනපතා ඒ කුණු කුඩය හෝ බාල්දිය ඒ ස්ථානයෙන් පිට පාර අයිනේ එහෙත් පාරේ ගමනාගමනයෙහි යෙදෙන රථවාහන වලට අවහිර නොවනසේ තැබිබවිය යුතුය; තවද,

(ආ) සභාවේ කසළ ශෝධක කම්කරුවන් විසින් ඒ කුණු කුඩය හෝ බාල්දිය හිස් කරගෙන යනු ලැබීමෙන් පැය භාගයක් ඇතුළත දී ඒ කුඩය හෝ බාල්දිය එතැනින් ඉවත් කර විය යුතුය.

4. කිසිවෙකු විසින්, 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් කුණු කුඩයක් හෝ බාල්දියක් 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් යම් කාල වේලාවල් අතර හැර, කිසිම පාරක නො තැබිය යුතුය.

5. නගර ප්‍රදේශය ඇතුළතවූ යම්කිසි වීථියකින් හෝ පොදු ස්ථානයකින් අලු, කුණු රොඩු, කැලි කසළ හෝ කැත කුණු එකතු කිරීම හෝ ඉවත ගෙන යාම සභාපති විසින් එසේ කිරීමට බලය පවරනු ලැබ ඇතොත් මිස කිසිවකු විසින් නොකළ යුතුය.

6. කසළ ශෝධනයට අදාළ ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථා වලින් යම් අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රුපියල් විසිපහකට වැඩි නොවන දඩයකින් දඬුවම් කළ හැකි විය යුතු අතර ඒ උල්ලඝනය කිරීම දිගින් දිගටම කරගෙන යනු ලබන විට, නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් ඒ උල්ලංඝනය කිරීමට වරදකරු කරනු ලැබීමෙන් හෝ ඒ උල්ලඝනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සභාපති විසින් හෝ ඒ සඳහා සභාපති විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධරයකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු, ඒ උල්ලංඝනය කිරීම අඛණ්ඩවම කරගෙන යනු ලබන සෑම දිනකටම රුපියල් පහක් බැගින් වූ අතිරේක දඩයකින් දඬුවම් කළ හැකි විය යුතුය.

9–1330—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## රක්වාන සුළු නගර සභාව

### 1966 අතිරේක අය-වැය ලේඛණ අ ක 1

බී—මහජන සෞඛ්‍ය :

| | | රු. ශ. |
|---|---|---|
| 5. ජල සම්පාදනය. | | |
| (බී) උපකරණ | ... ... | 250 0 |
| (සී) නඩත්තු කිරීම | ... ... | 1,250 0 |
| | | 1,500.00 |

ඉහත දක්වෙන අතිරේක අය වැය ලේඛණය 1966 පෙබරවාරි මස 28 වන දින පවත්වන ලද සුළු නගර සභාවේ මාසික රැස්වීමේ අංක 6 දරණ යෝජනා ස්ථිරත්වය අනුව සම්මත කරගන්නා ලදී.

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1966 සැප්තැම්බර් මස 15 වන දින,
රක්වාන සුළු නගර සභා කාර්යාලයේදීය.

9–1328—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## රක්වාන සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (11) යටතේ කෙරෙන අයදුම්පතයි

1966 අය වැය ලේඛණයේ ඒ ඒ සිරස යටතේ වෙන් කරන ලද මුදල ඊට අනුරූපව දක්වෙන වැය සිරසට මාරුකර අවශ්‍යව තිබෙන අතිරේක වැය සඳහා එම සිරස යටතේ යෙදීමට 1966 ක්වූ අගෝස්තු මස 24 වෙනි දින පවත්වන ලද මෙම සුළු නගර සභාවේ මාසික රැස්වීමේ යෝජනා අංක 4 යටතේ සම්මත විය.

| අතිරික්තය | | රු. | අතිරේක ප්‍රතිපාදනය | | රු. |
|---|---|---|---|---|---|
| ඒ.1. (එම්) | නිල ඇඳුම් ... ... ... | 25 0 | ඩී.5. (බී) | උපකරන ... ... ... | 100 0 |
| ඒ.2. (එල්) | අතිකාල දීමනා ... ... | 100 0 | ඩී.5. (සී) | නඩත්තුව ... ... ... | 1,150 0 |
| ඒ.5. | පාසැල් පොත් ... ... | 375 0 | | | |
| බී.11. | භූමානයෝ ... ... ... | 200 0 | | | |
| ඩී.2. (ඒ) | වැටුප් කසල ශෝධක ... ... | 150 0 | | | |
| ඩී.3. (ඒ) | වැටුප් වැසිකිලි ශෝධක ... ... | 150 0 | | | |
| ඩී.5. (ඊ) | ඉදිකිරීම ... ... ... | 250 0 | | | |
| | | 1,250 0 | | | 1,250 0 |

1966 සැප්තැම්බර් මස 17 වන දින,
රක්වාන සුළු නගර සභා කාර්යාලයේදී ය.

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

9–1327—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

## දළුගම සුළු නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවෙනි පරිපූරක අයවැය ලේඛනය

වැය ශීර්ෂය

| | රු. ශ. |
|---|---|
| ඕ. 8 වැඩ දියුණු කිරීම ... ... | 7,079 0 |
| 9. 12 අලුත් වැඩ ... ... | 56,198 0 |
| | 63,277 0 |

1966.8.29 දින පවත්වන ලද මාසික සභා රැස්වීම යෝජනා අංක 25 යටතේ සභාව ඉහත සඳහන් වැය ශීර්ෂය ඔබගේ ලිපිය අනුව සංශෝධනය කර අනුමත කරගන්නා ලදි.

ආර්. ඇස්. පෙරේරා,
සභාපති,
දලුගම සුළු නගර සභාව.

1966 ක්වූ සැප්තැම්බර් මස 1 දින,
මහර-කඩවත
දලුගම සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරන ලදී.

බී. ලියනමාන,
1966.9.14. සහකාර පළාත් පාලන කොමසාරිස් (බ. කො).

9—1315—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## කහවත්ත සුළු නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවෙනි අතිරේක වැය යෝජනාව

අංක 4 දරණ තීරයේ සඳහන් රු. 6,000 අතිරේක වැය යෝජනාව 1966 සැප්තැම්බර් මස 2 වෙනි දින පවත්වන ලද රැස්වීමේදී සභා සම්මත විය.

| ශීර්ෂය | වර්ෂයට අනුමත වැය රු. ශ. | අදට වැය කරන ලද මුදල රු. ශ. | අතිරේක වැය අවශ්‍ය ප්‍රමාණය රු. ශ. | වැඩිපුර වියදමට හේතු |
|---|---|---|---|---|
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | | | |
| 5. ජලසම්පාදනය— | | | | |
| (ඊ) ඉදිකිරීම ... | 1,500 0 ... | 50 0 ... | 6,000 0 ... | කහවත්ත නගරයේ කැඩීබිදී වතුර නොලැබෙන පයිප්ප වෙනුවට අළුත් වඩා ලොකු පයිප්ප දැමීම |

මෙම සභාවේ මුදල් තත්වය මෙසේයි :—

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1966 ජනවාරි මස 1 වෙනි දිනට අධිකය ... ... ... | | 17,317 46 |
| ගණන් බලන ලද ආදයම ... ... ... ... | 57,578 0 | |
| බලාපොරොත්තු අධිකය ... ... ... ... | 502 0 | |
| | | 58,030 0 |
| එකතුව ... | | 75,397 46 |
| වර්ෂයට ගණන් බලන ලද වියදම ... ... ... | 57,076 0 | |
| අතිරේක වැය අංක 1 ... ... ... ... | 6,000 0 | |
| | | 63,076 0 |
| 1966.12.31 ගණන් බලන ලද අධිකය ... ... ... | | 12,321 46 |

ඇස්. බී. මාටින්සිංඤෝ,
කහවත්ත සුළු නගර සභාවේ සභාපති.

කහවත්ත,
1966 සැප්තැම්බර් මස 2 වැනි දින.

9–1317/1—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## කහවත්ත සුළු නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවෙනි අතිරේක වැය යෝජනාව

1 වෙනි කොටස

වියදම් ශීර්ෂයෝ

| | රු. ශ. |
|---|---|
| ඩී.—මහජන සෞඛ්‍යය :— | |
| 5. ජල සම්පාදනය— | |
| (ඊ) ඉදිකිරීම ... ... ... ... | 6,000 0 |
| එකතුව ... | 6,000 0 |

1966 සැප්තැම්බර් මස 2 වෙනි දින පවත්වන ලද සාමාන්‍ය රැස්වීමේ අංක 3 දරණ යෝජනාවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව සභා සම්මතවිය.

ඇස්. බී. මාටින්සිංඤෝ,
කහවත්ත සුළු නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
කහවත්ත, 1966 සැප්තැම්බර් මස 2 වැනි දින.

අනුමත කරන ලදී.

ඇල්. පී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්, රත්නපුර.

1966 සැප්තැම්බර් මස 18 දින,
රත්නපුරේ දී ය.

9–1317/2—66 9,30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

## කහවත්ත සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (II) කොටස යටතේ අයදුම් පත්‍රය

### වර්ෂ 1966 අය වැය ලේඛනය

1966 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂයන් යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරු කර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1966 අගෝස්තු මස 5 වෙනි දින පවත්වන ලද සාමාන්‍ය රැස්වීමේ දී අංක 21 දරණ සම්මුතියෙන් සභා සම්මත විය :—

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| 2. සංස්ථා වියදම්— | | |
| (ජේ) අමතර වියදම් ... ... | 150 | 0 |
| 5. පාසල් පොත් ... ... ... | 137 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 2. නඩත්තු කිරීම ... ... ... | 2,500 | 0 |
| | 2,787 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| 2. සංස්ථා වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු ... ... | 650 | 0 |
| (ඊ) නීතිය පිළිබඳ වියදම් ... ... | 550 | 0 |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශන හා කාර්යාල වියදම් | 800 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (කේ) කිරි පරීක්ෂණය ... ... | 37 | 0 |
| 2. කුණු කසල ශෝධනය— | | |
| (බී) කරත්ත, ගොනුන් හා ලොරි ... | 700 | 0 |
| ඊ.—මහජන සාදයෝ :— | | |
| 7. විනෝද බදු ... ... ... | 50 | 0 |
| | 2,787 | 0 |

සුළු නගර සභා කාර්යාලය,
කහවත්ත, 1966 අගෝස්තු මස 20 වැනි දින.

ඇස්. බී. මාටින් සිංඤ්ඤෝ,
කහවත්ත සුළු නගර සභාවේ සභාපති.

9–1317/3—66.9 30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## මතුගම සුළු නගර සභාව

### 1966 අය-වැය ලේඛනය

### 1 වැනි කොටස—සාමාන්‍ය

### සුළු නගර සභා මුදල් නියෝග අංක 40 (ii) යටතේ කෙරෙන අයදුම් පතයි

1966 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත සඳහන් මුදල් අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක වැය පියවා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි යෙදවීමට 1966 ජූලි 15 වැනි දින පවත්වනු ලැබූ මතුගම සුළු නගර සභාවේ විශේෂ රැස්වීමේදී අංක 2 දරණ යෝජනා ස්ථිරත්ව යෙන් සභා සම්මත කරණ ලදී.

| ඉතිරි මුදල | රු. | ශ. | අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|---|---|---|
| බී.—මහා මාර්ග :— | | | | | |
| (12) අළුත් වැඩ ... ... ... | 1,000 | 0 | ඒ (4) ආධාර හා දීමනා ... ... | 1,000 | 0 |

1966.9.19 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්‍යාලයේදීය

දයා ටී. පස්කුවල්,
සභාපති,
සුළු නගර සභාව, මතුගම.

9–1331—66.9,30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## මතුගම සුළු නගර සභාව

### 1966 අය-වැය ලේඛනය

### 1 වැනි කොටස—සාමාන්‍ය

### නගර සභා මුදල් නියෝග 40(II) යටතේ කෙරෙන අයදුම්පතයි

1966 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලනලද පහත සඳහන් මුදල්, අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක වැය පියවා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි යෙදීමට 1966 ජූලි මස 29 වැනි දින පවත්වනු ලැබූ රැස්වීමේ අංක 5 දරණ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදී.

| ඉතිරි මුදල | රු. | ශ. | අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඒ.2 (ඩී)—තක්සේරුකරුවන්ගේ ගාස්තු ... ... | 39 | 0 | බී.—මහා මාර්ග :— | | |
| ඒ.2 (ජී)—කරත්ත සහ බෝට්ටු තහඩු ... ... | 10 | 0 | (7) අත්පත්කර ගැනීම් ... ... | 850 | 0 |
| ඒ.2 (ඇල්)—නිල ඇඳුම් ... ... ... | 251 | 0 | | | |
| ඩී.1 (ජේ)—සෞඛ්‍ය සතිය සඳහා වියදම් ... ... | 50 | 0 | | | |
| ඩී.3 (ජී)—ඉදිකිරීම ... ... | 500 | 0 | | | |
| එකතුව ... | 850 | 0 | එකතු ව... | 850 | 0 |

1966.9.20 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්‍යාලයේදීය.

දයා ටී. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

9–1334/1—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

## මතුගම සුළු නගර සභාව

### 1966 අය-වැය ලේඛනය

### I වැනි කොටස—සාමාන්‍ය

**සුළු නගර සභා මුදල් නියෝග අංක 40 (II) යටතේ කෙරෙන අයදුම් පතයි**

1966 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත සඳහන් මුදල්, අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක වැය පියවා ගැනීම සඳහා පහත දක්වා ඇති පරිදි යෙදවීමට 1966 සැප්තැම්බර් මස 17 වැනි දින පවත්වනු ලැබූ විශේෂ රැස්වීමේ අංක 2 දරණ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කරණ ලදී.

| ඉතිරි මුදල | රු. | ශ. |
|---|---|---|
| ඒ(1) (ජී) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 388 | 0 |
| ඒ(2) (ඒ) ආධාර (එලවන්ස්) ... ... | 120 | 0 |
| ඒ(2) (බී) ගමන් ගාස්තු ... ... ... | 80 | 0 |
| ඒ(2) (ඩී) තක්සේරු කරන්නන් සඳහා ගාස්තු ... | 200 | 0 |
| ඒ(2) (අයි) නිවාඩු දුම්රිය ප්‍රවේශ පත්‍ර ... ... | 100 | 0 |
| බී(12) අළුත් වැඩ ... ... ... | 350 | 0 |
| බී(13) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 120 | 0 |
| ඩී(1) (සී) ආධාර (එලවුන්ස්) ... ... | 140 | 0 |
| ඩී(1) (කේ) කිරි වර්ග කිරීමේ වියදම් ... ... | 100 | 0 |
| ඩී(2) (ඒ) වේතන ... ... ... | 1,200 | 0 |
| ඩී(2) (ඊ) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 665 | 0 |
| ඩී(3) (ඒ) වේතන ... ... ... | 200 | 0 |
| ඩී(3) (එෆ්) අත්පත්කර ගැනීම ... ... | 250 | 0 |
| ඩී(3) (එච්) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 300 | 0 |
| ඩී(5) (ඊ) ඉදිකිරීම ... ... ... | 1,000 | 0 |
| ඊ(2) නඩත්තු කිරීම ... ... ... | 1,000 | 0 |
| ඊ(7) විනෝද බදු පරීක්ෂණය ... ... | 50 | 0 |
| ජේ(1) වේතන ... ... ... | 425 | 0 |
| එකතුව ... | 6,688 | 0 |

| අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|
| ඒ(1) (සී) ආදායම් පරීක්ෂක ... ... | 34 | 0 |
| ඒ(1) (ඩී) පියන්වරු සහ පනිවුඩ කරුවෝ ... | 585 | 0 |
| සී(1) වේතන ... ... ... | 310 | 0 |
| සී(4) නඩත්තු කිරීම ... ... | 2,095 | 0 |
| සී(8) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 35 | 0 |
| ඩී(5) (එච්) ප්‍රසිද්ධ නානාස්ථාන ... ... | 2,100 | 0 |
| ඩී(6) (ඒ) වේතන ... ... ... | 115 | 0 |
| ඩී(6) (බී) නඩත්තු කිරීම ... ... | 554 | 0 |
| ඩී(6) (ඩී) ජීවන හා විශේෂ ජීවනාධාර ... | 60 | 0 |
| ඩී(7) (එච්) ජීවන හා විශේෂ ජීවනාධාර ... | 50 | 0 |
| ජේ(2) දෛනික වැටුප් ... ... | 80 | 0 |
| ජේ(6) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 670 | 0 |
| එකතුව ... | 6,688 | 0 |

### II වැනි කොටස—විදුලිය

| ඉතිරි මුදල | රු. | ශ. |
|---|---|---|
| 3(ඒ) උපකරණ ... ... ... | 205 | 0 |
| එකතුව ... | 205 | 0 |

| අතිරේක ප්‍රතිපාදන | රු. | ශ. |
|---|---|---|
| 4(ඒ) පරිපාලන වේතන හා ආධාර ... ... | 30 | 0 |
| 4(බී) සංචාරක වේතන හා ආධාර ... ... | 175 | 0 |
| එකතුව ... | 205 | 0 |

1966.9.19 වැනි දින,
මතුගම සුළු නගර සභා කාර්‍යාලයේදීය.

දයා ටී. පස්කුවල්,
මතුගම සුළු නගර සභාවේ සභාපති.

9-1334/2—66.9.30 දින අංක 14.715 දරන ගැසට් පත්‍රය

---

## දේපල විකිණීම්

### මොරටු නගර සභාව

**කටුබැද්ද නිවාස හිඟ ගෙවල් කුලී සඳහා දේපළ විකිණීම පිළිබඳවයි**

මොරටුව නගර සභාවට අයත් කටුබැද්ද නිවාස ක්‍රමයෙහි ලැබිය යුතු හිඟ ගෙවල් කුලී සම්බන්ධයෙන් පලාත් පාලන සභා ආඥපනතේ 170 (1) දරණ වගන්තියෙන් කියවෙන මහ නගර සභා ආඥපනතේ 252 වෙනි වගන්තිය අනුව මොරටුව නගර සභාවේ සභාපතිතුමා විසින් නිකුත් කරණ ලද වරෙන්තුවක බලය පිට තහනම් කර අල්ලා ගන්නා ලද පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන බඩුබාහිරාදිය එකී දේපල වෙනුවෙන් ලැබිය යුතු හිඟ ගෙවල් කුලී සහ වියදම් යථා කාලයෙහි ගෙවනු නොලැබුවහොත් ඒවා 1966.10.3 වෙනි දින පූ.භා. 10.00 ට මොරටු නගර සභා කාර්යාලයය භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

| විස්තර | | නිවාස අංක | කාලය |
|---|---|---|---|
| (1) සාමාන්‍ය පුටු<br>සාමාන්‍ය මේස (ලාච්චු රහිත) | 3<br>1 | ... ... ... 2/1 | ... 1965 අප්‍රියෙල් සිට 1966 අප්‍රියෙල් දක්වා |
| (2) පාච්චි නොකරණ ලද ඇඳන්<br>පිඟන් තබන රාක්ක<br>සාමාන්‍ය මේස | 1<br>1<br>1 | ... ... ... 2/8 | ... 1965 දෙසැම්බර් සිට 1966 අප්‍රියෙල් දක්වා |

1966 සැප්තැම්බර් 15 වැනි දින,
නගර සභා කාර්යාලයය,
මොරටුව.

ටී. එල්. සී. පීරිස්,
මොරටු නගර සභාපති.

9-1318—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

## මාතලේ මහ නගර සභාව

### හිඟ වරිපනම් සඳහා දේපල විකිණීම

තහනම් කිරීම සඳහා චංචල දේපල නැති හෙයින් 1965 දෙවන කාර්තුව අවසානය දක්වා මෙයට යාකර ඇති උපලේඛනයෙහි දක්වෙන ස්ථානයන් වෙනුවෙන් ලැබිය යුතු හිඟ වරිපණම් සම්බන්ධයෙන්, මහ නගර සභා ආඥපනතේ (252 වන පරිච්ඡේදයේ) 252 වන ඡේදය අනුව මවිසින් නිකුත් කරන ලද, වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) අවුරුදු 1 සිට 10 දක්වා ඇති කුලිය සහ ලාභ, (2) ලීදඬු සහ උපදින ද්‍රව්‍ය, (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලවත්, ඒවා වෙනුවෙන් ලැබිය යුතු වරිපණම් ගාස්තු සහ වියදම් යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත් සඳහන් එකී දිනයන්හි පූ.භා. 9 ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට පටන්ගනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. ටී. පීරිස්,
නාගරික කොමසාරිස්,
මාතලේ.

නාගරික සභා කායාීලය,
මාතලේ, 1966.9.12.

### උපලේඛනය

**16.10.1966**

අගලවත්ත-හරස්ගම පාර : 15, 23/10, 8.

එපිටමුල්ල ලේන් : 23, 23/1.

හරස්ගම පාර : 15/1, 45, 85/3, 85/4, 66/6.

රජ වීදිය : 153, 155/26, 155/30, 155/34, 77/8, 79/1, 106/6, 106/8, 132/6, 32/1, 34/1.

අගලවත්ත පාර : 3, 15 ඒ, 15 ටී, 13, 17, 21, 31, 41, 41/2, 45, 58/2, 58/4, 62, 62/2 ඒ, 62/5, 78/2, 80/1සී, 80/1ඩී, 80/ටී, 80/1එෆ්, 80/1 ජී, 88.

**17.10.1966**

බෝමලුව පාර: 7/3, 15/2, 15/3, 8, 14බී.

පටු මාවත අංක 1 : 15, 15ඒ, 15/1, 23, 23/1, 23/2, 23/3, 25, 33/2, 4, 6, 12, 12/2, 14/3, 22, 22/1, 24, 24/1, 24/2, 26, 28/1, 28/2.

පටුමාවත අංක 2 : 8/3 බී, 8/8ඒ, 8/8 ටී, 7/2, 9 ඒ, 9, 17.

පන්සල පාර : 22.

**18.10.1966**

මහදෙවට පාර : 8ඒ, 12/1, 16/5, 30/8, 9/3, 9/5, 9/7, 9/10.

මීවත්තාකුඹුර පාර : 6/1, 12/3, 12/7, 27, 35/1, 47, 53, 75/5.

උපාරිස් පෙදෙස : 6/2, 7/4.

විහාර පාර : 96/4, 96, 96/5, 98, 100, 114ඒ, 95, 97, 97/5, 103.

**19.10.1966**

විහාර පාර : 11/1, 11/4, 11/9, 11/10, 41, 51/3, 51/5, 53/2, 57, 57ඒ, 22, 38/1, 38/2, 38/5, 38/6, 38/7, 42/2, 44/4, 44/5, 44/8, 46/5, 50/1, 50/2, 50/7, 50/8, 50/9, 50/10, 56, 58, 58/2, 68, 70, 36/2ඒ, 36/3, 36/4, 42/3.

**22.10.1966**

පිට්ටනිය පාර : 37, 71, 54, 60, 84, 102.

කව්වෙරි පාර : 40, 32/1, 34/1.

මල්වත්ත පාර : 21/24, 49, 53, 4/5, 10/16, 30, 40, 4/1, 4/2, 8.

හුලංගමුව පාර : 36/3, 36/4, 36/5, 106, 108, 150/21, 112, 166, 202, 258/8, 19සී, 19ටී, 19ජේ, 19/ඇල්, 65/1, 161, 223/1, 225.

**23.10.1966**

පහලගම්මැද්ද පාර : 8/13.

පුල්ලෙයාර් කොවිල් පාර : 11/6.

නුවර පාර : 49.

කුඹියන්ගොඩ පාර : 59.

ඇම්.සී. 1 වෙනි මාවත : 23, 29, 10ඒ.

ඇම්.සී. 2 වෙනි මාවත : 19/2, 19/6, 19/7, 19/10, 24.

ඇම්.සී. පාර : 101, 164, 188/4.

නාගොල්ල පාර : 227.

නාගොල්ල ගමේ පාර : 88/3, 88/8, 27, 37/2.

උද්‍යාන මාවත : 11.

දෙඩන්දෙනිය පාර : 37/1, 41, 55, 10.

දෙඩන්දෙනිය රවුම් පාර : 3, 58/4 ඒ.

**24.10.1966**

ගොන්ගාවෙල පාර : 7/2, 45, 127, 131, 133.

දුම්රිය පොල පාර : 35, 17, 31.

දෝලෙ මාවත : 9, 9/1, 9/2, 11, 20, 38.

දෝලෙ පාර : 7/9, 7/13, 7/14.

හැරිසන්ස් ජෝන්ස් පාර : 36/16ඒ, 63/1.

හුසේන් මාවත : 22, 28/2, 22ඒ, 9, 13.

මොලන්දපිටිය පාර : 1, 26/6, 26/11, 26/12, 28/1, 36, 40/2, 48/8, 48/10.

මුහන්දිරම් පාර : 26, 26/1, 34, 63ඒ, 20.

**25.10.1966**

හෙට්ටි වීදිය : 9.

ගොඩපොල පාර : 7/10, 17, 7/1, 60/2, 60/3, 84, 90/2, 106, 122, 126, 146/1, 166, 170, 91, 133/2, 147/3, 171.

බන්ඩාරපොල පාර : 5, 53, 53/6, 53/7, 53/8, 53/9, 53/10, 57, 2, 10, 12, 24, 34, 36/1, 36, 96/1.

කාරලන්ද පාර : 1, 27, 27/1, 27/4, 27/3, 14/1, 14/2, 36.

**26.10.1966**

ත්‍රිකුණාමල වීදිය : 483, 721/28, 721/29, 725, 745, 747, 791ඒ, 791, 791/1, 805, 815, 21, 45/1, 56, 60, 66, 68, 70, 74, 140, 252, 289, 417, 441, 488, 566, 618, 688, 712, 744, 746, 748, 754/3, 768/2, 770, 784/1, 786, 788, 800.

රත්තොට පාර : 10/2, 10/6, 30, 30/1, 40/ඒ, 35, 35/5, 37, 37/බී, 39, 17, 35/1.

9–1319—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය.

---

# විවිධ දැන්වීම්

## පෑලියගොඩ නගර සභාව

### 1967 වර්ෂය සඳහා රථවාහන සහ සත්ව බද්ද

### නගර සභා ආඥාපනත

1. පෑලියගොඩ නගර සභාව මගින්, නගර සභා ආඥාපණතේ 162 වැනි ඡේදය ප්‍රකාර (255 වැනි අධිකාරය), පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් කර තිබෙන ගණන් අනුව, රථ වාහන සහ සතුන් පිළිබඳව, පසුගිය වර්ෂයේදී අයකරන ලද බද්දම, 1967 වර්ෂයේදීත් පනවා ඇති බව, හා

2. එම ආඥාපණතේ 163(3) දරණ ඡේදය යටතේ, මෙකී බද්ද 1967 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතුව ඇත.

වින්සන්ට් රාජපක්ෂ,
පෑලියගොඩ නගර සභාවේ
සභාපති.

1966 සැප්තැම්බර් මස 16 වැනි දින,
පෑලියගොඩ නගර සභා කායාීලයේදී ය.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් ට්‍රිකාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, රික්ෂෝ, පාපැදි සහ ට්‍රයිසිකල් හැරුණ විට, අන් සෑම වාහනයක් සඳහා ... | 5 00 |
| 2. පාපැදි, ට්‍රයිසිකල්, පාපැදි කාර්, පාපැදි කරත්ත, ට්‍රයිසිකල් කාර් හෝ ට්‍රයිසිකල් කරත්ත සඳහා— | |
| (අ) වෙළඳ කටයුතු සඳහා යොදවන්නේ නම් ... | 5 00 |
| (ආ) වෙළඳ කටයුතුවලින් තොර පාවිච්චිය සඳහා ... ... | 1 00 |
| 3. ගොන් දෙන්නා බඳින කරත්ත සඳහා ... | 5 00 |
| 4. තනි ගොනා බඳින කරත්ත සඳහා ... ... | 3 00 |
| 5. තිරික්කල, බක්කි කරත්ත සහ අත් කරත්ත සඳහා | 3 00 |
| 6. රික්ෂෝ සඳහා ... ... | 2 50 |

9–1321—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

## පැලියගොඩ නගර සභාව

### 1967 වර්ෂය සඳහා සුනඛ බද්ද

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (334 වැනි අධිකාරය)

(334 වැනි අධිකාරය) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි ඡේදය ප්‍රකාර, පැලියගොඩ නගර සභා සීමාව තුල ඇතිකරන සෑම බල්ලෙක් සඳහා රු. 1.00 ක් ද, සෑම බැල්ලියක් සඳහා රු. 1.50 ක්ද, 1967 වර්ෂය වෙනුවෙන් පනවා ඇති අතර, මෙම බද්ද 1967 අප්‍රේල් මස 1 වැනි දිනට පෙර ගෙවිය යුතුව ඇත.

වින්සන්ට් රාජපක්ෂ,
පැලියගොඩ නගර සභාවේ සභාපති.

1966 සැප්තැම්බර් මස 16 වැනි දින,
පැලියගොඩ නගර සභා කායාීලයේදී ය.

9–1314—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන පොදු ආදශී අතුරු ව්‍යවසථා පනත

පළාත් පාලන ආයතන පොදු ආදශී අතුරු ව්‍යවසථා පනතේ 3 වන වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර මැදපළාත ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි 8 වන දින අ ක 14.703 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද්දවූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාව කින් අනුමත කරන ලද බව 1966 ජූලි 15 වන දින අංක 14,704 දරන ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල (39), (40) හා (41) වන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට යටිනුවර මැදපළාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවසථා) පනතේ (261 වන පරිච්ඡේදය) 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

එම්. එල්. එම්. ඉබ්‍රාහිම්,
යටිනුවර මැදපළාත ගම්සභාවේ සභාපති.

1966 අගෝස්තු 26 වන දින,
යටිනුවර මැදපළාත ගම්සභා කායාීලයේදීය,
පිලිමතලාව.

9–1313—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු අතුරු ව්‍යවස්ථාවල 38 වැනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට කන්තලේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදයේ) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ඇම්. රන්බණ්ඩා,
කන්තලේ ගම්සභාවේ සභාපති තැන.

1966.8.19 වැනි දින,
ගම්සභා කාර්යාලය,
වෙන්ඩරුසන් පුර, කන්තලේ.

7–1316—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත (261 වැනි අධිකාරය)

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ විජයරාජ පළාත ගම් සභාව විසින් සම්මත කර ගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රියෙල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවසථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වැනි දින අ ක 14,-87 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූ, එකී අතුරු ව්‍යවසථා මාලාවේ අංක 38 දරණ කාණ්ඩයද, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මතකර ගැනීමට විජයරාජ පළාත ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ආර්. බී. රංබන්ඩා,
විජයරාජ පළාත ගම්සභාවේ සභාපතිතැන.

ගම්සභා කායාීලය,
තබ්බෝව, 1966.8.25

9–1325—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුක්වැව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

"පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් 10 වැනි දින අංක 10,5 7 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වාවූ කාණ්ඩ, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට කුඹුක්වැව ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවසථා) පනතේ (264 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ඇස්. ඇම්. කපුරු බණ්ඩා,
සභාපති තැන.

1966 ක්වූ අගෝස්තු මස 24 වැනි දින,
කුඹුක් ගැටේ-ඉබ්බාගමුව,
කුඹුක්වැව ගම්සභා කාර්යාලයේදීය.

9–1326/1—66.9.30 දන අංක 14,715 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඹුක්වැව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කර සිටිනු ලැබේ.

**යෝජනාව**

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වැනි දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් සම්මත කරන ලද බව 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරන ගැසට් පත්‍රයේ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 38 දරන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට කුඹුක්වැව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවසථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ."

ඇස්. ඇම්. කපුරු බණ්ඩා,
සභාපතිතැන.

1966 ක්වූ අගෝස්තු මස 24 වැනි දින,
කුඹුක් ගැටේ-ඉබ්බාගමුව,
කුඹුක්වැව ගම්සභා කාර්යාලයේදීය.

9–1326/2—66.9.30 දින අංක 14,715 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. එහි දක්වෙන නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අපමාදව එහි ලැබීමට ගතවෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

### 1966

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | ... | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව 3.30 |

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වැලව්වත්තයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි